(4) නිපුණතාව- කෘෂි බෝග වල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ක්‍රම විධි සැලසුම් කරයි.

(4.1) නිපුණතා මට්ටම

පසු අස්වනු හානිය කෙරෙහි බලපාන සාධක විමසා බලයි.

" සංවර්ධිත රටවල පසු අස්වනු හානිය 10% කි. සංවර්ධනය වෙමින් පවතින රටවල එය 20% - 40% දක්වා ඉහල අගයක් ගනී."

1. පසු අස්වනු හානිය යන්න හඳුන්වන්න.

2. පසු අස්වනු හානිය කෙරෙහි අපගේ අවධානය යෙමු කිරීමේ වැදගත්කම සොයා බලන්න. * පසු අස්වනු හානිය කෙරෙහි බලපාන සාධක ප්‍රධාන කාණ්ඩ දෙකකි.

1 පෙර අස්වනු සාධක.

2 පසු අස්වනු සාධක.

3. ඉහත සඳහන් සාධක දෙක කෙටියෙන් හඳුන්වන්න.

4. පසු අස්වනු සාධක තවදුරටත් අභ්‍යන්තර හා බාහිර සාධක ලෙස ආකාර දෙකකි. ඒවා වෙන වෙනම හඳුනා ගන්න.

(11 ශ්‍රේණිය පෙලපොත පිටු අංක 56 - 60 දක්වා)